# සංක්ෂිප්තය

වර්තමාන පර්යේෂණය යොමුවූයේ 6 ශ්‍රේණියේ සිසුන් සිංහල භාෂාව ලිවීමේ දී සිදුකරන දුර්වලතා පිළිබඳ අධ්‍යයනයක් ක්‍රියාත්මක කිරීම සඳහා ය. 6 ශ්‍රේණියේ සිසුන් සිංහල භාෂාව ලිවීමේ දී සිදුකරන දුර්වලතා හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. එසේ ම එම දුර්වලතා ඇතිවීම කෙරෙහි බලපාන හේතු සාධක විමර්ශනය කිරීම හා එම දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම ද මෙම පර්යේෂණය මඟින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ය. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා පර්යේෂකයා විසින් සමීක්ෂණ පිරිසැලසුමක් භාවිත කරනලදී. දෙනියාය අධ්‍යාපන කලාපයේ, පස්ගොඩ අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටි පාසල් 05 ක් ඇසුරෙන් සිසු නියැදිය තෝරගනු ලැබී ය. 2013 වර්ෂයේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70 ට වඩා අඩුවෙන් ලබාගත් සිසුන් 50 ක නියැදියක් හා 6 ශ්‍රේණියට සිංහල විෂයය උගන්වන ගුරුවරුන් 10 ක නියැදියක් ද මේ සඳහා තෝරා ගන්නා ලදී.

සිසු නියැදිය පිළිබඳ දත්ත රැස්කර ගැනීම සඳහා අනාවරණ පරීක්ෂණ හා නාභිගත කණ්ඩායම් සාකච්ඡා භාවිත කළ අතර ප්‍රශ්නාවලියක් ඇසුරෙන් ගුරු නියැදියෙන් ද දත්ත රැස්කර ගැනීමට හැකිවිය. පර්යේෂකයා විසින් රැස්කර ගනු ලැබූ දත්ත විශ්ලේෂණය කිරීම ප්‍රධාන ආකාර දෙකක් යටතේ සිදුකර තිබේ. එහි දී ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණයට මුල්තැන ලබා දුන් අතර ගුණාත්මක ක්‍රමයට ද දත්ත විශ්ලේෂණය කරන ලදි. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා වගු, ප්‍රස්තාර, ප්‍රතිශත, කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් හා අපකිරණ මිනුම් භාවිත කර තිබේ. ගුණාත්මක දත්ත විශ්ලේෂණය විස්තරාත්මක ක්‍රමයට සිදුකර ඇත.

මෙම අධ්‍යයනය තුළින් ප්‍රධාන අනාවරණ හයක් හඳුනා ගැනීමට හැකි විය. ඉන් ප්‍රධාන අනාවරණය වූයේ සිසුන්ගේ සිංහල භාෂාව ලිවීමේ සාධන මට්ටම් එකිනෙකාට වෙනස් බවයි. සිසුන්ගේ භාෂාව ලිවීමේ කුසලතා දුර්වලවීම සඳහා සිසුන් හා සම්බන්ධ සාධක සෘජුව ම බලපා තිබෙන බවත්, ගුරුවරුන් හා පවුල් පරිසරයේ බලපෑම නිසා දරුවන්ගේ ලිවීමේ දුර්වලතා ඇතිවන බවත් හඳුනාගනු ලැබූ තවත් අනාවරණ දෙකකි. සිසුන්ගේ ලිවීමේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ගුරුවරුන්ගේ කාර්යභාරය වඩා වැදගත් බව, ලිවීමේ දුර්වලතා මඟහරවා ගැනීම සඳහා සිසුන්ගේ උනන්දුව හා කැපවීම අත්‍යවශ්‍ය බව හා පාසල් මට්ටමින් සිසුන්ගේ ලිවීමේ කුසලතා අතර විවිධතා පවතින බව සෙසු අනාවරණ වේ. පර්යේෂණය ආශ්‍රිතව ඉදිරිපත් කරන පර්යේෂණ යෝජනා ප්‍රධාන ක්ෂේත්‍ර පහක් යටතේ විග්‍රහ කරන ලදී. එනම් ගුරුවරුන්, සිසුන්, දෙමාපියන්, පාසල හා විෂයය මාලා සම්පාදකයින්ට අදාළ යෝජනා වශයෙන් ඒවා කොටස් කර තිබේ. එම එක්

එක් ක්ෂේත්‍රයට අදාළ යෝජනා වෙන වෙනම විග්‍රහ කරන ලදී. අවසන් වශයෙන් සිසුන්ගේ ලිවීමේ දුර්වලතා අවම කිරීම සඳහා ගුරුවරුන්ට පන්ති කාමරය තුළ දී අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග ලැයිස්තුවක් ද ඉදිරිපත් කර තිබේ.